# දුම් අනතුරු හඟවන (Smoke alarms)

නීතියට අනුව, වික්ටෝරියානු ප්‍රාන්තය තුල ඇති සියළුම නිවෙස්වල අවම වශයෙන් එක් මහලක එක් දුම් අනතුරු හඟවනයක්වත් සවිකර තිබිය යුතුය.

**වෙනස් කල නොහැකි කුටියක් තුල ඇති වසර 10ක් පවතින ලිතියම් බැටරි සහිත ෆොටෝඉලෙක්ට්‍රික් දුම් අනතුරු හඟවන (photoelectric smoke alarms) MFB සහ CFA මගින් නිර්දේශ කෙරේ.**

- ෆොටෝඉලෙක්ට්‍රික් දුම් අනතුරු හඟවන වඩා කාර්යක්ෂම වන අතර වැරදි අනතුරු හැඟවීම් සඳහා ඇති ඉඩකඩ අඩුය.
- එවා විදුලි සැපයීමකට සම්බන්ධ කලයුතු නොවන (240v ප්‍රධාන විදුලිය හා සම්බන්ධ කල යුතු නැත) අතර විදුලි රැහැන් සමග සම්බන්ධ කල යුතු නැත (240v ප්‍රධාන විදුලි රැහැන් හා සම්බන්ධ කල යුතු නැත)







### මාසිකව පරීක්ෂා කර බලන්න

- විදුලි බොත්තම ඔබන්න
- අනතුරු හඟවනය තුන් වරක් ශබ්ද නගන තෙක් බොත්තම තදකරගෙන සිටින්න

### වාර්ෂිකව දූවිලි පිස දමන්න

- දුම් අනතුරු හඟවනයේ දූවිලි පිස දමන්න නැතිනම් එහි කවරය වටා සියුම්ව පිස දමන්න

* අදාල වන්නේ නම්, වාර්ෂිකව දුම් අනතුරු හඟවනයේ බැටරිය නැවත දමන්න

### සෑම වසර 10කට වරක්ම නව අනතුරු හඟවනයක් සවි කරන්න

- සියළුම දුම් අනතුරු හඟවන (විදුලි රැහැන්වලට සම්බන්ධ සහ වෙනමම ඇති) නැවත සවි කිරීම කල යුතුය

MFB CFA

# මාගේ දුම් අනතුරු හඟවනය සවිකරන්නේ කොතැනද?

- දුම් අනතුරු හඟවන සවිකල යුත්තේ බිත්තියේ සිට අවම වශයෙන් සෙමී 30ක් දුරින් සිවිලිමෙහිය.
- දුම් අනතුරු හඟවන සවිකල යුත්තේ නිදන ප්‍රදේශ සහ නිවසේ ඉතිරි ප්‍රදේශ අතරය.
- කිසිවෙකු දොර වසා නිදා ගන්නේ නම්, එම කාමරය තුල දුම් අනතුරු හඟවනයක් සවිකර තිබිය යුතුය.
- දුම් අනතුරු හඟවන ඕස්ට්‍රේලියානු සම්මත (Australian Standard) AS3786 සපුරාලිය යුතුය.

Certified Product
Australian Standard

නිදන කාමර සහ නිවසේ ඉතිරි ප්‍රදේශ අතර සවිකර තිබිය යුතුය

අමතර ආරක්ෂාව සඳහා ඔබ විසින් දුම් අනතුරු හඟවන සවිකල හැකි ස්ථාන

